# තෙරසමො පාඨො

භූතපුබ්බං භික්ඛවෙ සක්කො දෙවානමින්දො මාතලිං සඞ්ගාහකං ආමන්තෙසි. යොජෙහි සම්ම, මාතලි, සහස්සයුත්තං ආජඤ්ඤරථං. උය්‍යානභූමිං ගච්ඡාම සුභූමිං දස්සනායාති. එවං භද්දන්තවාති ඛො භික්ඛවෙ මාතලි සඞ්ගාහකො සක්කස්ස දෙවානමින්දස්ස පටිස්සුත්වා සහස්සයුත්තං ආජඤ්ඤරථං යොජෙත්වා සක්කස්ස දෙවානමින්දස්ස පටිවෙදෙසි. යුත්තො ඛො තෙ, මාරිස, සහස්සයුත්තො ආජඤ්ඤරථො යස්සදානි කාලං මඤ්ඤසීති. අථ ඛො භික්ඛවෙ සක්කො දෙවානමින්දො වෙජයන්තපාසාදා ඔරොහන්තො පඤ්ජලිකො පුථුද්දිසා නමස්සති. අථ ඛො භික්ඛවෙ මාතලි සඞ්ගාහකො සක්කං දෙවානමින්දං ගාථාය අජ්ඣභාසි.

තං නමස්සන්ති තෙවිජ්ජා - සබ්බෙ භුම්මා ච ඛත්තියා,
චත්තාරො ච මහාරාජා - තිදසා ච යසස්සිනො,
අථ කො නාම සො යක්ඛො - යං ත්වං සක්ක නමස්සසීති.

අහඤ්ච සීලසම්පන්නෙ - චිරරත්තසමාහිතෙ,
සම්මා පබ්බජිතෙ වන්දෙ - බ්‍රහ්මචරියපරායනෙ.

යෙ ගහට්ඨා පුඤ්ඤකරා - සීලවන්තො උපාසකා,
ධම්මෙන දාරං පොසෙන්ති - තෙ නමස්සාමි මාතලී ති.

**( සක්කනමස්සන සුත්ත සංයුත්තනිකාය)**

පද මාලාව

| | | | |
|---|---|---|---|
| **භූතපුබ්බං** | **(නි)** | **-** | පෙර වූවකි |
| **සක්කො** | **(නා)** | **-** | ශක්‍රයා |
| **දෙවානමින්දො** | **(සං)** | **-** | දෙවියන්ගේ අධිපති |
| **මාතලිං** | **(නා)** | **-** | මාතලි දෙව්පුත් |
| **සඞ්ගාහකං** | **(නා)** | **-** | රියදුරු |
| **යොජෙහි** | **(ක්‍රි)** | **-** | යොදවව |
| **සම්ම** | **(නි)** | **-** | මිත්‍රය |
| **සහස්සයුත්තං** | **(ස)** | **-** | දහසක් යොදන ලද |
| **ආජඤ්ඤරථං** | **(ස)** | **-** | ආජානීය අශ්වරථය |
| **උය්‍යානභූමිං** | **(ස)** | **-** | උයන් බිම |
| **සුභූමිං** | **(ස)** | **-** | රමණීය භූමිය |
| **දස්සනායාති** | **(සං)** | **-** | දකිනු පිණිස |

| | | | |
|---|---|---|---|
| භද්දන්තවාති | (සං) | - | ඔබට යහපතක් වේවා යැයි |
| පටිස්සුත්වා | (පූ.ක්‍රි) | - | පිළිතුරු දී |
| පටිවෙදෙසි | (ක්‍රි) | - | දැන්වීය |
| මාරිස | (නා) | - | නිදුකාණෙනි |
| යස්සදානි | (සං) | - | යමකට දැන් |
| කාලං | (නා) | - | කාලය |
| මඤ්ඤසී | (ක්‍රි) | - | හඟිහි |
| වෙජයන්තපාසාදා | (ස) | - | විජයොත් පහයෙන් |
| ඔරොහන්තො | (කි) | - | බසින්නේ |
| පඤ්ජලිකො | (නා) | - | බඳින ලද ඇඟිලි ඇත්තේ |
| පුථුද්දිසා | (සං) | - | සියලු දිශා |
| නමස්සති | (ක්‍රි) | - | වඳියි |
| අජ්ඣභාසි | (ක්‍රි) | - | පැවසීය |
| තෙවිජ්ජා | (ත) | - | ත්‍රිවිද්‍යා ඇත්තේ |
| සබ්බෙ | (ස.නා) | - | සියල්ලෝ |
| භුම්මා | (නා) | - | බිම වසන |
| චත්තාරො | (නා) | - | සතර |
| තිදසා | (ස) | - | තව්තිසා වැසියෝ, දෙවියෝ |
| යසස්සිනො | (ත) | - | කීර්තිමත් වූ |
| චිරරත්ත | (නි) | - | බොහෝ කල් |
| සමාහිතෙ | (සං) | - | එකඟ කළ සිත් ඇති |
| බ්‍රහ්මචරියපරායනෙ | (ස) | - | බඹසර එක ම මඟ ගත් |
| ගහට්ඨා | (ත) | - | ගිහියෝ |
| පුඤ්ඤකරා | (කි) | - | පින්කරන |
| දාරං | (නා) | - | අඹුදරු |
| පොසෙන්ති | (ක්‍රි) | - | පෝෂණය කරති |

අභ්‍යාස

1. 'තෙ නමස්සාමි මාතලී' ඡේදය සිංහලට නගන්න.

2. පහත සඳහන් ප්‍රශ්නවලට පාලියෙන් පිළිතුරු සපයන්න.

i. සක්කො දෙවානමින්දො මාතලිං සංගාහකං කිං කථෙසි?
ii. මාතලි පන සක්කස්ස දෙවානමින්දස්ස කො අහචි?
iii. සක්කො දෙවානමින්දො කුතො ඔරොහි?
iv. ගහට්ඨානං කෙ ගුණා භවන්ති?
v. සක්කො කෙසං වන්දති?

3. ඡේදය ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. සක් දෙව්රජ මාතලි දිව්‍යපුත්‍රයාට පැවසුවේ කුමක් ද?
ii. මාතලි දිව්‍යපුත්‍රයා සක් දෙවිඳුන්ගේ කුමන කාර්යයක් ඉටු කරයි ද?
iii. මෙම ඡේදයේ සඳහන් සක් දෙව්රජුගේ සම්පත් මොනවා ද?
iv. සතරවරම් දෙව්රජවරුන්ගේ නම් ලියන්න
v. සක් දෙව්රජුගේ වන්දනා ගරු බුහුමනට පාත්‍රවන්නේ කුමන කටයුතු කරන පිරිස් ද?

## කිතක පද

### හැඳින්වීම

ධාතුවකට ප්‍රත්‍යයක් එක්කොට සාදාගනු ලබන නාම කිතක නම් වේ.

| | | | |
|---|---|---|---|
| **ධාතුව** | + **ප්‍රත්‍යය** | = | **කිතක නාමය** |
| වන්ද | + මාන | = | වන්දමාන |
| පාල | + අක | = | පාලක |

කිතක නාමය නාමපදයක් මෙන් විභක්තිවල වරනැගේ. ලිංග භජනය කෙරේ. සාම්ප්‍රදායික ව්‍යාකරණයෙහි කිතක පද විවිධ ස්වරූපයෙන් වර්ග කොට ඇත. පාලි භාෂාව තේරුම් ගැනීමට අත්‍යන්තයෙන් උපකාර වන කිතක පද කීපයක් මෙහි දී හඳුන්වා දෙමු.

### වර්තමාන කිතක

**"වත්තමානෙ මානන්තා"** යන බාලාවතාර සූත්‍රයට අනුව වත්තමාන කාලයෙහි **"මාන"** හා **"අන්ත"** යන ප්‍රත්‍යය යෙදී වර්තමාන කිතක පද සෑදේ.

| ධාතුව | ප්‍රත්‍යය | කිතක නාමය |
|---|---|---|
| වන්ද | මාන | වන්දමාන |
| වන්ද | අන්ත | වන්දන්ත |
| ලභ | මාන | ලභමාන |
| ලභ | අන්ත | ලභන්ත |

වර්තමාන කෘදන්ත පද මිශ්‍රක්‍රියා වශයෙන් ද විශේෂණ වශයෙන් ද නාම පද වශයෙන් ද යෙදේ.

- දාරිකා **රොදන්තී** මාතරං උපසංකමි. (දැරිය හඬමින් මව වෙත ගියාය) (මිශ්‍රක්‍රියා)
- ථෙරො ධම්මං **සුණන්තො** රුක්ඛමූලෙ අට්ඨාසි. (තෙරුන් වහන්සේ ධර්මය අසමින් ගස මුල සිටි සේක)

වර්තමාන කෘදන්ත පද විශේෂණ පද ලෙස යෙදෙන විට විශේෂ්‍ය පදය ලිංගයෙන් විභක්තියෙන් සමාන වේ.

**වන්දන්තො සාමණෙරො**
**වන්දන්තෙහි සාමණෙරෙහි**
**නිසීදන්තී වනිතා**
**නිසීදන්තීනං නාරීනං**
**පතන්තානි ඵලානි**
**පතන්තෙසු ඵලෙසු**

ආදි වශයෙනි.

උදාහරණ:-

**වනං ගච්ඡන්තො පුරිසො විරවන්තං දීපිං පස්සති.**
(වනයට යන්නා වූ පුරුෂයා ගොරවන කොටියෙකු දකියි)
**ධම්මසාලායං නිසීදන්තියො වනිතායො දෙසෙන්තං ධම්මං සුණිංසු.**
(ධර්මශාලාවෙහි හුන්නා වූ කාන්තාවෝ දේශනා කරන්නා වූ ධර්මය ඇසූහ)

වර්තමාන කෘදන්ත පද වාක්‍ය දෙකක් එක් වාක්‍යයක් බවට පත්කිරීමට ද උපයෝගි කර ගැනේ.

**සීහො සයති - මිගො සීහං පස්සති**
**මිගො සයන්තං සීහං පස්සති.**

**ඵලානි පතන්ති - වනිතා ඵලානි ඔචිනාති**
**වනිතා පතන්තානි ඵලානි ඔචිනාති.**

**භික්ඛු පිණ්ඩාය චරති - උපාසකා භික්ඛුනො දානං දෙන්ති**
**පිණ්ඩාය චරන්තස්ස භික්ඛුනො උපාසකා දානං දෙන්ති.**

**අව්‍යය කිතක පද**

අව්‍යය කිතක පද ලෙස සැලකෙනුයේ වරනොනැගෙන කෘදන්ත පදයි. එනම්, පූර්ව ක්‍රියා හා තුමන්ත ක්‍රියාවන් ය. පූර්වක්‍රියා යනු කර්තෘගේ අවසාන ක්‍රියාවට මුලින් සිදුවෙන ක්‍රියාවන් ය. බාලාවතාරයේ **"පුබ්බකාලෙකකත්තුකානං තුනත්වානත්වා වා"** යන සූත්‍රයෙන් **තුන, ත්වාන, ත්වා** යන ප්‍රත්‍යය යෙදෙන බව දැක්වේ.

වන්ද + තුන = වන්දිතුන
වන්ද + ත්වාන = වන්දිත්වාන
වන්ද + ත්වා = වන්දිත්වා

වශයෙන් පද සිද්ධ වේ.

"**සබ්බෙහි තුනාදීනං යො**" යන සූත්‍රයෙන් තුනාදි ප්‍රත්‍යයවලට "ය" යන්න ආදේශ වේ.

බොහෝ විට උපසර්ග පූර්ව ධාතුවලට මෙම ආදේශය වේ.

**අභි + වන්ද + ය > අභිවන්දිය**
**අපි + දහ + ය > පිදහිය**
**උප + නී + ය > උපනීය**

ඇතැම් ධාතුන්ගෙන් පරව තුනාදි ප්‍රත්‍යයවලට ''**රච්ච, ම්ම, ය්හ, බ්භ, ද්ධ**'' යන ආදේශ වේ.

| | |
|---|---|
| පටි + ඉ + රච්ච | - පටිච්ච |
| වී + මුච + රච්ච | - විමුච්ච |
| ආ + ගමු + ම්ම | - ආගම්ම |
| අව + කමු + ම්ම | - ඔක්කම්ම |
| ප + ගහ + ය්හ | - පග්ගය්හ |
| සං + මුහ + ය්හ | - සම්මුය්හ |
| ප + මද + ජ්ජ | - පමජ්ජ |
| උ + පද + ජ්ජ | - උපජ්ජ |
| ආ + රහ + බ්භ | - ආරබ්භ |
| උප + ලහ +බ්භ | - උපලබ්භ |

එකම උක්තය සහිත වාක්‍ය රාශියක් පූර්වක්‍රියා මගින් තනි වාක්‍යයක් කළ හැකි ය.

කුලපුත්තො ධම්මං **සුණි.** සො කාමෙසු ආදීනවං **පස්සි.** සො **පබ්බජි.** සො **උපසම්පජ්ජි.**
කුලපුත්තො ධම්මං **සුත්වා** කමෙසු ආදීනවං **දිස්වා පබ්බජිත්වා** උපසම්පජ්ජි.

## තුමන්ත ක්‍රියා

**ඉච්ඡත්ථෙසු සමානකත්තුකෙසු තවෙ, තුං** වා යන සූත්‍රයට අනුව සමාන කර්තෘක කිරීමට කැමති යන අර්ථයෙහි **තවෙ**/ **තුං** ප්‍රත්‍යය යෙදේ.

| | | |
|---|---|---|
| වන්ද + තුං | - වන්දිතුං | - වඳින්නට |
| වන්ද + තවෙ | - වන්දිතවෙ | - වඳින්නට |
| කර + තුං | - කාතුං | - කරන්නට |
| කර + තවෙ | - කාතවෙ | - කරන්නට |

මෙය ද වාක්‍යය දෙකක් එක් කිරීමේ ප්‍රයෝජනයෙන් යුතු ය.

සාමණෙරො පරිවෙණං **ගච්ඡති** - සාමණෙරො තත්‍ථ පාලිභාසං **උග්ගණ්හාති.**
සාමණෙරො පාලිභාසං **උග්ගණ්හිතුං** පරිවෙණං ගච්ඡති.

කුමාරො විහාරං **ගච්ඡති** - කුමාරො බුද්ධං **වන්‍දති.**
කුමාරො බුද්ධං **වන්දිතුං** විහාරං **ගච්ඡති.**

**ත්‍රෛකාලික කෘදන්ත**

කාල තුනේ ම යෙදෙන කෘදන්ත පදයි. මේවා කොටස් දෙකකි.

i. **භාවකාරක, කර්මකාරක දෙකෙහි යෙදෙන කෘදන්ත (කිච්ච කෘදන්ත)**
ii. **කර්තෘකාරකයෙහි යෙදෙන කෘදන්ත (කිත් කෘදන්ත)** වශයෙනි.

භාවකාරක, කර්මකාරක අර්ථයන්හි යෙදෙන කෘදන්ත ප්‍රත්‍යය කීපයකි. **තබ්බ, අනීය ණ්‍ය, ණීය, රිච්ච** වශයෙනි. ඒවායින් සිද්ධ වන පද මෙසේ ය.

| | | |
|---|---|---|
| **කර + තබ්බ - කත්තබ්බ** | | (කළ යුතුයි) |
| **ගමු + තබ්බ - ගන්තබ්බ** | | (යා යුතුයි) |
| **වන්‍ද+ තබ්බ - වන්දිතබ්බ** | | (වැඳිය යුතුයි) |
| **කර + අනීය - කරණීය** | | (කළ යුතුයි) |
| **වන්‍ද+ අනීය - වන්‍දනීය** | | (වැඳිය යුතුයි) |
| **මර + අනීය - මරණීය** | | (මැරිය යුතුයි) |
| **වද + ණ්‍ය - වජ්ජ** | | (කිව යුතුයි) |
| **ගමු + ණ්‍ය - ගම්‍ය** | | (යා යුතුයි) |
| **කර + ණීය - කාරිය** | | (කළ යුතුයි) |
| **මර + ණීය - මාරිය** | | (මැරිය යුතුයි) |
| **කර + රිච්ච - කිච්ච** | | (කළ යුතුයි) |
| **භර + රිච්ච - භච්ච** | | (පෝෂණය කළ යුතුයි) |

මේවා භාවකාරක, කර්මකාරක දෙකෙහි යෙදෙන නිසා කර්තෘ පදය තතියාවෙන් යෙදේ.

**අම්හෙහි** පුඤ්ඤං කත්තබ්බං.
**කස්සකෙහි** ඛෙත්තං කසිතබ්බං.
**තුම්හෙහි** කත්තබ්බං කුසලං චරිතබ්බං බ්‍රහ්මචරියං
ආදි වශයෙනි.

**කර්තෘකාරක කෘදන්ත**

මෙහි යෙදෙන ප්‍රත්‍යය රාශියකි. ක්‍රියාමූලයකින් (ධාතුවෙන්) නිපදවෙන බොහෝ නාම මෙම ගණයෙහි ලා ඇතුළත් කෙරේ. එහි යෙදෙන ප්‍රත්‍යය කීපයක් හා කිතකපද කීපයක් පහත දැක්වේ.

ණ ප්‍රත්‍යය

කර + ණ - කාර / කර යනාදි පද යෙදෙන්නේ වෙනත් කර්ම පදයක් සමගය.

**කුම්භ** + **කර** + **ණ** - **කුම්භකාර**
**රථ** + **කර** + **ණ** - **රථකාර**
**ධම්ම** + **ධර** + **ණ** - **ධම්මධර**
**දින** + **කර** + **ණ** - **දිනකර**

**"සබ්බතො ණ්වුත්වාවී වා"** යන සූත්‍රයෙන් කර්තෘකාරකයේ දී **"අ, ණ්වු, තු, ආවී"** යන ප්‍රත්‍යය යෙදේ. මෙම ප්‍රත්‍යයන්ට **"අන, අක"** යන ආදේශ ද වේ.

අක ප්‍රත්‍යය

| | | | |
|---|---|---|---|
| දා | + **අක** | - **දායක** | (දෙන්නා) |
| **නී** | + **අක** | - **නායක** | (නායකයා) |
| **සු** | + **අක** | - **සාවක** | (අසන්නා) |
| **පාල** | + **අක** | - **පාලක** | (පාලනය කරන්නා) |

අන ප්‍රත්‍යය

| | | | |
|---|---|---|---|
| **ගහ** | + **අන** | - **ගහන** | (ගැනීම) |
| **පාල** | + **අන** | - **පාලන** | (පාලනය) |
| **යාච** | + **අන** | - **යාචන** | (සිඟීම) |
| දා | + **අන** | - **දාන** | (දීම) |

තු ප්‍රත්‍යය

| | | | |
|---|---|---|---|
| **කර** | + **තු** | - **කත්තු** | (කරන්නා) |
| **හර** | + **තු** | - **හත්තු** | (පෝෂණය කරන්නා) |
| **වද** | + **තු** | - **වත්තු** | (කියන්නා) |
| **දා** | + **තු** | - **දාතු** | (දෙන්නා) |

ආවී ප්‍රත්‍යය

**භය + දිස + ආවි - භයදස්සාවී**

ණී ප්‍රත්‍යය

**පාප + කර + ණී - පාපකාරී**
**ධම්ම + වද + ණී - ධම්මවාදී**

"**සාසාදීහි රත්‍ථු**" යන සූත්‍රයෙන් "**සාසු**" ආදි ධාතුන්ගෙන් පරව "**රත්‍ථු**" ප්‍රත්‍යය යෙදේ.

**සාස + රත්‍ථු - සත්‍ථු** (අනුශාසකයා)

"**පාදිතො රිතු**" - "**පා**" ආදි ධාතුවලින් පසුව "**රිතු**" ප්‍රත්‍යය යෙදේ.

**පා + රිතු - පිතු** (රකින්නා)
**ධර + රිතු - ධීතු** (ධරන්නා)

"**මානාදීහි රාතු**" "**මාන**" ආදි ධාතුවලින් පසුව "**රාතු**" ප්‍රත්‍යය යෙදේ.

**මා + රාතු - මාතු**
**භාස + රාතු - භාතු**

මේ ආදි ප්‍රත්‍යය රාශියකින් කර්තෘ කාරක කෘදන්ත පද සෑදේ. මෙම කෘදන්ත පද බොහෝ විට සාමාන්‍ය නාමපද ලෙස භාවිත වේ. මෙවැනි ක්‍රියා මූලිකව සෑදුණු නාම පද පිළිබඳ අවධානය යොමු කරන්න.

## අතීත කෘදන්ත පද

" **අතීතෙ ත තවන්තු තාවී** " යන සූත්‍රයට අනුව අතීතකාලයෙහි යෙදෙන කෘදන්ත ප්‍රත්‍යය තුනකි. "**ත, තාවී, තවන්තු**" යනුවෙනි.

**භුජ + ත - භුත්ත** (අනුභව කළ)
**භුජ + තාවි - භුත්තාවී** (අනුභව කළ)
**භුජ + තවන්තු - භුත්තවන්තු** (අනුභව කළ)

පාලි භාෂාවේ බහුලව භාවිත වී ඇත්තේ "**ත**" ප්‍රත්‍යයාන්ත කෘදන්ත පදයි. "**ත**" ප්‍රත්‍යයට විවිධ වෙනස්කම් මෙහිදි සිදුවී ඇති බැව් පහත නිදසුන්වලින් ප්‍රකට වේ.

■ ඇතැම් කෘදන්ත පද සෑදීමේ දී ධාත්වන්තය ලොප් වී "**ත**" ප්‍රත්‍යය ද්විත්ව වේ.

**භුජ + ත - භුත්ත** (අනුභව කළ)
**යුජ + ත - යුත්ත** (යොදන ලද)
**මුච + ත - මුත්ත** (මිදුණු)
**සුප + ත - සුත්ත** (නිදාගන්නා ලද)
**පද + ත - පත්ත** (පැමිණි)

■ "ධ, භ, හ, " අන්ත ධාතූන් කෙරෙන් "**ත**" ප්‍රත්‍යය වූ විට ප්‍රත්‍යය සමග ධාත්වන්තය ද්විත්ව වේ.

**කුධ + ත - කුද්ධ** (කිපුණු)
**ආ + රභ + ත - ආරද්ධ** (පටන්ගන්නා ලද)
**සං + නහ + ත - සන්නද්ධ** (සන්නද්ධ වූ)
**ලුභ + ත - ලුද්ධ** (ඇලුණු)
**දුහ + ත - දුද්ධ** (දොවන ලද)
**යුධ + ත - යුද්ධ** (යුද්ධ කරන ලද)
**බධ + ත - බද්ධ** (බැඳුණු)

■ "**ම**" කාරාන්ත ධාතූන් කෙරෙන් "**ත**" ප්‍රත්‍යය වූ කල ධාත්වන්තය සමග "**ත**" ප්‍රත්‍යයට "**න්ත**" ආදේශ වේ.

**සම + ත - සන්ත** (සමනය වූ)
**දම + ත - දන්ත** (දැමුණු)
**නි + කමු + ත - නික්ඛන්ත** (නික්මුණු)
**ප + කමු + ත - පක්කන්ත** (යනලද)

■ "**කර**" ආදි ධාතුවලින් පසුව ධාත්වන්තය ලොප් වී "**ත**" ප්‍රත්‍යයට "**ඉණ්ණ**" ආදේශ වේ.

**තර + ත - තිණ්ණ** (එතර වූ)
**පුර + ත - පුණ්ණ** (පිරුණු)
**ජර + ත - ජිණ්ණ** (දිරුණ)
**ආ + කිර + ත - ආකිණ්ණ** (ගැවසීගත්)

■ සමහර විට "**ත**" ප්‍රත්‍යයට "**ඉන්න**" ආදේශ වේ.

**භිද + ත - භින්න** (බිඳුණු)
**නි + සද + ත - නිසින්න** (හුන්)

■ සමහර විට "ත" ප්‍රත්‍යයට "ඊන" ආදේශ වේ.

| | | |
|---|---|---|
| ප + හා+ ත - **පහීන** | (ප්‍රහීණ කළ) |
| නි + ලී + ත - **නිලීන** | (සැඟවුණ) |

■ ඒකස්වර ධාතුන්ගෙන් "ත" ප්‍රත්‍යය වෙනසකට පත් නොවී යෙදේ.

| | |
|---|---|
| භූ + ත - **භූත** | (වූ) |
| ඤා + ත - **ඤාත** | (දැනගත්) |

■ ඇතැම් තැනෙක ධාතුවටත් ප්‍රත්‍යයටත් අතර ඉකාරයක් ආගම වේ.

| | | |
|---|---|---|
| **පච** + ත | - **පචිත** | (පිසින ලද) |
| **මණ්ඩ** + ත | - **මණ්ඩිත** | (සරසන ලද) |
| **කථ** + ත | - **කථිත** | (කියන ලද) |
| **ලිඛ** + ත | - **ලිඛිත** | (ලියන ලද) |

■ ඇතැම් ධාතුන් කෙරෙන් "ඉට්ඨ" හෝ "ට්ඨ" ආදේශ වේ.

| | |
|---|---|
| **දිස** + ත - **දිට්ඨ** | (දක්වන ලද) |
| **නස** + ත - **නට්ඨ** | (නැසුණු) |
| **ඵුස** + ත - **ඵුට්ඨ** | (ස්පර්ශ කළ) |
| **පුච්ඡ** + ත - **පුට්ඨ** | (විමසන ලද) |

■ ආදේශයන්හි විවිධ ස්වරූප පෙන්වන අතීත කෘදන්ත පද

| | | |
|---|---|---|
| **භන්ජ** + ත | - **භග්ග** | (බිඳුණු) |
| **වස** + ත | - **වුත්ථ** | (වසන ලද) |
| **හර** + ත | - **හට** | (ගෙනයන ලද) |
| **සු** + කර + ත | - **සුකට** | (මනාව කරන ලද) |

■ සමහර විට ප්‍රත්‍යයට හා ධාත්වන්තයට "ළ්හ" ආදේශ වේ.

| | | |
|---|---|---|
| **ආ** + රුහ + ත | - **ආරූළ්හ** | (නගින ලද) |
| **ගාහ** + ත | - **ගාළ්හ** | (දැඩි කරන ලද) |
| **බහ** + ත | - **බාළ්හ** | (දැඩි කරන ලද) |
| **මුහ** + ත | - **මූළ්හ** | (මුළා වූ) |

**අභ්‍යාස**

1. වර්තමාන කෘදන්ත පද යොදාගෙන තනි වාක්‍යය සේ නිර්මාණය කරන්න.

   නිදසුන :-

   - කුමාරො සයති - මාතා කුමාරං පබොධෙති.
     මාතා සයන්තං කුමාරං පබොධෙති.

| | | |
|---|---|---|
| i. | කුමාරා කීළන්ති | - දායකො කුමාරානං පානීයං දෙති. |
| ii. | මිගා ධාවන්ති | - සීහො මිගෙ අනුබන්ධති. |
| iii. | සාමණෙරො විහාරං ගච්ඡති | - උපාසකා සාමණෙරං අනුගච්ඡන්ති. |
| iv. | කුමාරිකා ගංගාය සීදති | - කුමාරො කුමාරිං උත්තාරෙති. |
| v. | යාචකො ධනං යාචති | - සෙට්ඨී යාචකස්ස ධනං දෙති. |

2. පහත සඳහන් වාක්‍යයන් පූර්වක්‍රියා පද යොදා තනි වාක්‍යයක් සේ ලියන්න.

i. සාවත්ථීවාසී කුලපුත්තො ජෙතවනං අගමාසි.
ii. සො භගවතො සන්තිකෙ ධම්මං සුණි.
iii. සො කාමෙසු ආදීනවං පස්සි.
iv. සො පබ්බජි.
v. සො උපසම්පජ්ජි.
vi. සො සත්ථු සන්තිකෙ කම්මට්ඨානං අග්ගහෙසි.
vii. සො විපස්සනං වඩ්ඪෙසි.
viii. සො අරහත්තං පාපුණි.

3. පහත සඳහන් ඡේදයෙන් කිතක පද 30ක් උපුටා දක්වන්න.

අථස්ස එතදහොසි. සත්ථාරා චත්තාරො පුග්ගලා කථිතා, තෙසු මයා පදපරමෙන භවිතබ්බං, නත්ථි මඤ්ඤෙ මය්හං ඉමස්මිං අත්තභාවෙ මග්ගො වා ඵලං වා, කිං කරිස්සාමි අරඤ්ඤවාසෙන, සත්ථු සන්තිකං ගන්ත්වා රූපසොභග්ගප්පත්තං බුද්ධසරීරං ඔලොකෙන්තො මධුරං ධම්මදෙසනං සුණන්තො විහරිස්සාමීති පුන ජෙතවනමෙව පච්චාගමාසි. අථ නං සන්දිට්ඨසම්භත්තා ආහංසු, ආවුසො, ත්වං සත්ථු සන්තිකෙ කම්මට්ඨානං ගහෙත්වා සමණධම්මං කරිස්සාමීති ගතො, ඉදානි පන ආගන්ත්වා සඞ්ගණිකාය අභිරමමානො චරසි, කිං නු ඛො තෙ පබ්බජිතකිච්චං මත්ථකං පත්තං, අප්පටිසන්ධිකො ජාතොසීති? ආවුසො, අහං මග්ගං වා ඵලං වා අලභිත්වා අභබ්බපුග්ගලෙන මයා භවිතබ්බන්ති විරියං ඔස්සජිත්වා ආගතොම්හීති. අකාරණං තෙ, ආවුසො, කතං දළ්හවිරියස්ස සත්ථු සාසනෙ පබ්බජිත්වා විරියං ඔස්සජන්තෙන, අයුත්තං තෙ කතං, එහි තථාගතස්ස දස්සෙමාති තං ආදාය සත්ථු සන්තිකං අගමංසු.

4. ඔබ උපුටාගත් කිතක පද පහත වගුවේ වර්ග කරන්න.

| වත්තමාන | අව්‍යය | ත්‍රෛකාලික | අතීත |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

5. පහත දී ඇති ධාතුන්ගේ කිතක පද සෑදෙන අයුරු ලියන්න.

| ධාතුව | වර්තමාන කිතක | පූර්ව ක්‍රියා | තුමන්ත ක්‍රියා | කිච්ච කිතක භාවකාරක | අතීත |
|---|---|---|---|---|---|
| කර | කරොන්ත | කරිත්වා | කරිතුං/ කාතුං | කත්තබ්බං | කතං |
| ගච්ඡ | | | | | |
| පච | | | | | |
| දිස | | | | | |
| කථ | | | | | |
| ලිඛ | | | | | |
| පුච්ඡ | | | | | |

6. සිංහලට නගන්න.

i. මයා දීයමාන ආහාරං සො යාචකො න පටිගණ්හාති.
ii. කස්සකෙන දණ්ඩෙන පහරියමානං තං බලිවද්දං අහං පස්සිං.
iii. සෙනාපතිනා හත්ථෙ ධාරියමානං අසිං දිස්වා චොරා භායිත්වා පලායිංසු.
iv. චොරො එකස්මිං ගුමෙබ නිලීයිත්වා ධෙනුං අපහරිතුං උපායං චින්තෙසි.
v. සාමණෙරො යට්ඨියා කොට්ටිං ගහෙත්වා ථෙරස්ස පුරතො ගච්ඡි.

7. පාලියට නගන්න.

i. ඔබ විසින් සිය අතින් කපනු ලබන ගස ගෙය මත වැටුණේ ය.
ii. දැහැමි රජහු විසින් රකිනු ලබන රටෙහි ජනයෝ සුවසේ වාසය කරත්.
iii. ඔහු බාල වියෙහි මනාව ශිල්ප ඉගෙන ගෙන පසුව දියුණුවට පැමිණියේ ය.
iv. වඳුරා ලොකු බල්ලකු දැක බියවී ගසෙන් බිමට වැටුණේ ය.
v. සුමේධ තවුසා අහසින් යන්නේ දීපංකර බුදුන් දැක උන්වහන්සේට වැන්දේ ය.

8. කෙටි පිළිතුරු සපයන්න.

i. 'කිතක' යනු මොනවා ද?
ii. ත්‍රෛකාලික කිතක යනු මොනවා ද?
iii. අව්‍යය කිතක යනු මොනවා ද? උදාහරණ 05ක් ලියන්න.
iv. පුට්ඨ, ආරද්ධ, යුත්ත, ආරූළ්හ, දිට්ඨ, යන පදවල ධාතු ප්‍රත්‍යය වෙන්කර ලියන්න.
v. "තෙ නමස්සාමි මාතලි" යන ඡේදයේ එන කිතක පද 5ක් උපුටා ලියන්න.